# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2111/44 - 2019 පෙබරවාරි මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2019.02.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට නායයෑමෙන් අවතැන්වූවන් වෙත පානීය ජලය ලබාදීමට පිරිපහදු ඒකකය හා ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 පෙබරවාරි මස 15 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1423.

### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 44A හබලක්කාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හබලක්කාව ගමේ පිහිටි කොබේකඩුවහේන නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 20ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | අනුරේඛන අංක KE/ARN/2016/392 හි කැබලි අංක M හා J ; |
| *දකුණට* | : | අඩි 3ක් පළල අඩිපාර ; |
| *බටහිරට* | : | අඩි 3ක් පළල අඩිපාර. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 01. එම්. සමිලා දිසානායක මිය,
B/18/1, මාදිලිය,
හෙම්මාතගම.

03 - 357


1A - G 29518 — 39 (2019/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට හෙම්මාතගම ජල සම්පාදන ක්‍රමයේ ගැවිලිපිටිය ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක අයිතිය අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 පෙබරවාරි මස 15 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1424.

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 45D නාරංගම්මන වසමේ නාරංගම්මන ගමේ පිහිටි අඹදෙනිය ගැවිලිපිටිය නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 40ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | තැඹිලි අඹේවත්ත ; |
| *නැගෙනහිරට* | ඃ | තැඹිලි අඹේවත්ත හා වතු මාර්ගය ; |
| *දකුණට* | ඃ | වතු මාර්ගය ; |
| *බටහිරට* | ඃ | එම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* ඃ 01. ප්‍රධාන විධායක නිලධාරී,
කෑගල්ල වැවිලි සමාගම,
අරණායක.

03 - 358